
# රුවන්මැලි මහා සෑය



සම්පාදක

ශ්‍රී කළ්‍යාණි යෝගාශ්‍රමාධිපති
ත්‍රිපිටකධාරාචාර්ය කර්මස්ථානාචාර්ය
අති පූජනීය නාඋයනේ අරියධම්ම ස්ථවිරයන් වහන්සේ

# හැඳින්වීම

සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ අගය දැක්වෙන විශ්මිත නිර්මාණ මහ පොලොව මත බොහෝ ඇත. ඒ කිසිවක් බුදුපියාණන් වහන්සේගේ නියෝග මත ගොඩ නැගුන දෑ නොවේ. ඒවා සැදැහැති - නුවණැති දෙවි මිනිසුන් විසින් නිවන් පතා ගොඩ නගන ලද පූජනීය වස්තුය. එවැනි ලෝක පූජිත වස්තූන් අතර රුවන්මැලි මහසෑය අග්‍රගණ්‍ය වේ. අද්විතීය වේ. අසහාය වේ. අසදෘශ වේ.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංඝ සංස්ථාවේ ප්‍රධාන අනුශාසක, ත්‍රිපිටකධරාචාර්ය, කර්මස්ථානාචාර්ය, පූජ්‍යපාද නා උයනේ ශ්‍රී අරියධම්මාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ 68 වැනි ජන්ම දිනය වෙනුවෙන් සිදු කරන අසිරිමත් පාරමී පින්කම වෙනුවෙන්, ස්වර්ණමාලී චෛත්‍ය රාජයන් වහන්සේගේ ඓතිහාසික ධර්ම විවරණය ඒ මාහිමියන් වහන්සේගේම ප්‍රියංකර වචනයෙන් ලියැවී මුද්‍රණය වූ මේ අගනා දහම් පොත ද එම පිංකමේම ධර්ම දාන අංශයට අයත් මහඟු පිංකමකි.

මෙයින් අප ලබන කුසල් බලය පාරමී සුවයෙන් යුතුව, අටසැට වැනි ජන්ම දින සපුරන ස්වකීය ජීවිතයම බුද්ධ පූජාවක් කරගත් පූජ්‍යපාද නා උයනේ ශ්‍රී අරියධම්ම මාහිමියන් වහන්සේට නිදුක්ව නිරෝගීව එක්සිය විසිවස් කල් දීර්ඝායුඃ ශ්‍රී වින්දනයට හේතු වේවා. පාරමී ගමන නිර්බාධකව සාර්ථක වී උතුම් සම්බුදු පදවිය ලබන්නට වාසනා වේවා.

මේ උතුම් කුසල් බලය අපවත් වී වදාළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංඝ සංස්ථා සමුත්පාදක අතිගරු රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංසාභිධාන නායක මාහිමියන් වහන්සේටද එම සංස්ථාවෙහි ප්‍රධානාචාර්ය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඤාණාරාම නායක මාහිමියන් වහන්සේටද, එම සංඝ සභාවේ සභාපති පණ්ඩිත ගැටමාන්නේ ශ්‍රී විමලවංස මාහිමියන් වහන්සේටද, උතුම් සම්බුදු පදවි ලබන්නට හේතු වාසනා වේවා.

තවද, මේ උතුම් කුසල් බලය මෙම ධර්ම පුස්තක මුද්‍රණයට අතහිත - ධනය යෙදූ මැද පෙරදිග සේවයේ නියුතු විජයපාල පෙරේරා මහතා සහ එම මහත්මියටත්, එම යුවලගේ ජීවමාන දෙමව්පියන්ට හා ඥාති මිත්‍රාදීන්ට ද, පරලෝ සැපත් ඥාති මිත්‍රාදීන්ට මේ පුණ්‍ය සම්භාරය අත්වේවා, කරනු ලබන රැකීරක්‍ෂා, ව්‍යාපාර කටයුතු දිනෙන් දින දියුණු වේවා, සම්‍යක් ප්‍රාර්ථනා ඉෂ්ඨ වේවා, සැමට නිවන් සුව ලැබේවා.

මේ පුණ්‍යාවකාශය ලබා දුන් අරියමග්ග සංවිධානයද පිනෙන් බැබලේවා.

මෙත් බෝසතුන් සහ විහාර මහා දේවී දුටුගැමුණු, සැදැහැතිස් දෙව් පරපුරටද සියලු සත්නටද මේ සියලු පින් ලැබේවා.


මෙයට - හිතෙෂී,<br>
**හැවන්පැලැස්සේ චන්ද්‍රවංස ස්ථවිර,**<br>
නාථගණ ආරණ්‍ය සේනාසනය,<br>
මහකෙළිය,මාස්පොත.<br>
2006.01.12

සබ්බ දානං ධම්ම දානං ජිනාති
සබ්බං රසං ධම්ම රසො ජිනාති
සබ්බං රතිං ධම්ම රතී ජිනාති
තණ්හක්ඛයෝ සබ්බ දුක්ඛං ජිනාති

ආමිස දාන සියල්ල අභිභවා ධර්ම දානය ජය ගනී
ආමිස රස සියල්ල අභිභවා ධර්ම රසය ජය ගනී
ආමිස ඇලීම් සියල්ල අභිභවා ධර්ම රතිය ජය ගනී
ලෞකික සැපදුක් සියල්ල අභිභවා අමා මහ නිවන ජය ගනී
(ධම්ම පද)

මහ පොලෝතලය සමතලා කොට අසුන් පනවා බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා වඩා හිඳුවා ප්‍රණීතතම සිවුපසයෙන් පූජා කරනවාටත් වඩා ලෝවාමහාපාය සුවාසූදහසක් වෙහෙර විහාර ජේතවනාරාම පූර්වාරාම වැනි විහාර ගොඩනැගීමටත් වඩා සතර පද ගාථාවකින් තරම්වත් කෙරෙන ධර්ම දානයම අති උතුම් යයි වදාළ බුද්ධ වචනය මුදුනින් පිළිගත් "අරියමග්ග" සංවිධානය මේ කුඩා දහම් පොත මුද්‍රණය කරවා ධර්මදාන වශයෙන් පිරිනමනුයේ අසීමිත ශ්‍රද්ධාවෙනි.

මේ දහම් පොත කියවන අයට අකුරක් පාසා බුද්ධාලම්බන ප්‍රීතිය පහළ වේවා. ශීල ගුණ බණ භාවනා වඩා දෙලොව ජයගෙන අමා මහ නිවන් සුවයම ලබත්වා යන පරම මෛත්‍රියෙන් යුතුව ධර්ම දනමය වශයෙන් මෙය මුද්‍රණය කරවා බෙදා දෙන "අරියමග්ග" සංවිධානයේ සාමාජික සියළු දෙනාටමත් එම සංවිධානය හා සමඟ ස්වර්ණමාලී චෛත්‍ය වන්දනා අසදෘශ පිංකම් මාලාව හා සම්බන්ධවන සියළු දෙනාටමත් සාම්පරායික ස්වර්ග සම්පත්තියත් ප්‍රාර්ථනීය උතුම් බෝධියකින් ශාන්ති ලක්ෂණ නිර්වාණ සම්පත්තියත් ඒකාන්තයෙන් සාක්ෂාත් වේවා.

**"සබ්බේ භද්‍රානි පස්සන්තු"**

මෙයට මෙතැති,

*නා උයනේ අරියධම්ම ස්ථවිර*

නා උයන ශ්‍රී කළ්‍යාණී යෝගාශ්‍රම සංස්ථා **සේනාසනය**

පන්සියගම, මැල්සිරිපුර

2550 - 2006

# ශ්‍රී ලංකාද්වීපයෙහි අසදෘශ
# ස්වර්ණමාලී මහා
# චෛත්‍යය රාජයාණන් වහන්සේ

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

"ඒවං අචින්තියා බුද්ධා
බුද්ධ ධම්මා අචින්තියා
අචින්තියෙසු පසන්නානං
විපාකො හොති අචින්තියො"ති

ශ්‍රීමත් ගෞතම ශාක්‍ය මුනීන්ද්‍ර දසබලධාරී සර්වඥ රාජෝත්තමයන් වහන්සේ මෙයින් අවුරුදු දෙදහස් පන්සීය අනූ සතරකට ඉහත බුද්ධගයා ශුද්ධ භූමියේ ජය සිරි මහ බෝ මැඩදී මාර පරාජය කොට සවාසන සකල ක්ලේශයන් සෝධා හැර සර්වඥතාඥාන සමධිගමයෙන් ලොවුතුරා සම්මා සම්බුද්ධ රාජ්‍යයට පත් වූ සේක.

සතළිස් පස් වසරක් මුළුල්ලේ දෙවියන් සහිත ලෝක සත්වයාහට සදහම් අමාව බෙදා දී සූවිසි අසංඛ්‍යයක් පමණ සත්වයන් අජරාමර අමා මහ නිවන් පුර පමුණුවා දෙදහස් පන්සිය එකුන් පනස් වසරකට පෙර කුසිණාරා නුවර උපවත්තන සාලවනෝද්‍යානයේ දී පිරිනිවන් වැඩි සේක.

මේ මහා භද්‍රකල්පයෙහි ලොව පහළ වූ කකුසඳ, කෝණාගමන, කාශ්‍යප නම් වූ සර්වඥයන් වහන්සේ තුන් නමගේම සර්වඥ ශාසනයන් පිහිටුවනු ලැබුවා වූ ශ්‍රී ලංකාද්වීපයට අපේ ගෞතම සර්වඥයන් වහන්සේ ද තුන්වරක් වැඩම කරවා ශ්‍රී ලංකාද්වීපය බුද්ධ භූමියක් හා සමාන බවට පමුණුවා වදාළ සේක.

ශ්‍රී ලංකාද්වීපය වෙනුවෙන් පඤ්චමහා අධිෂ්ඨානයක් කළ භාග්‍යවතුන්වහන්සේගේ පස්වැනි අධිෂ්ඨානය වූයේ, "බුද්ධ වර්‍ෂ 406 දී දුට්ඨ ගාමිණී අභය රජතුමා විසින් නිර්මාණය කරනු ලබන අනුරාධපුර ස්වර්ණමාලී මහා චෛත්‍යය රාජයාණන් වහන්සේ තුළ ද්‍රෝණයක් පමණ සර්වඥ ධාතූන් වහන්සේ නිධන් කිරීමේ උත්සවයේදී සර්වඥ ධාතූන් වහන්සේලා අහසට පැන නැගී නිර්මිත බුදුරුවක් මැවී සවණක් බුදුරැස් විහිදුවමින් යමා මහ පෙළහර දක්වනු ලැබේවා" යන අධිෂ්ඨානය ය. එය එසේම සිදුවිය.

## ලක්දිව බුදු සසුන පිහිටුවීම

ශ්‍රී බුද්ධ වර්ෂ 235 දී දඹදිව ධර්මාශෝක මහ රජාණන්ගේ සහායෙන් මොග්ගලී පුත්ත තිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් තුන්වැනි ධර්ම සංඝායනාව සිදුවිය. රටවල් නවයක සර්වඥ ශාසනය පිහිටුවන ලද අතර ශ්‍රී ලංකා ද්වීපයේ ශාසනය පිහිටුවීම පිණිස ලක්දිව වැඩම කරවා වදාලේ ධර්මාශෝක මහරජුගේ පුත්‍ර ද්වීපප්‍රසාදක මිහිඳු මහ රහතන් වහන්සේය.

දේවානම්පිය තිස්ස මහ රජාණන්ගේ සහායෙන් මිහිඳු මහ රහතන් වහන්සේ බුද්ධ වර්ෂ 236 පොසොන් පුර පසළොස්වක් පොහෝ දින සර්වඥ ශාසනය ශ්‍රී ලංකාද්වීපයෙහි පිහිටුවා වදාළහ.

සර්වඥ දකුණු අකු ධාතුව තැන්පත් කළ ථූපාරාම චෛත්‍යය රාජයන් වහන්සේ, ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ, යොත්නක් පාසා සර්වඥ ධාතු නිහිත චෛත්‍යය රාජයන් වහන්සේලා, අෂ්ඨ ඵලරුහ, දෙතිස් ඵලරුහ බෝධීන් වහන්සේලා, ආදී පූජනීය වස්තු පිහිටුවීමෙන් ද තුන් යොදුන් මහා සීමාව පිහිටුවීමෙන් ද, භික්ෂු ශාසනය ඇතිකොට ථූපාරාම විනය සංඝායනාව පැවැත්වීමෙන්ද, මෙහෙණි සස්න පිහිටුවීමෙන් ද, දේවානම්පියතිස්ස මහ රජතුමාගේ අනුග්‍රහයෙන් මහ පොළොව ලවා සාධුකාර දෙවමින් අනුබුදු මිහිඳු මහ රහතන්වහන්සේ විසින් සිරි ලක්දිව සර්වඥ ශාසනය පිහිටුවන ලද්දේ විය.

සිවු බුදුවරයන් වහන්සේ විසින් රහතන් වහන්සේලා සමඟ සමාපත්තියට සමවැදීමෙන් පරිභෝග කළ ස්වර්ණමාලී චෛත්‍ය ස්ථානයේ, ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා ද්‍රෝණයක් පමණ නිධන් කොට චෛත්‍යයක් බැන්දවිය යුතු බවත්, දේවානම්පියතිස්ස මහ රජුගේම මුණුබුරු දුටුගැමුණු රජතුමා විසින් එම චෛත්‍ය රාජයා නිර්මාණය කරනු ලබන්නේ යයිද මිහිඳු මහ රහතන් වහන්සේ වදාල වචනය අසා බලවත් සතුටට පත් රජතුමා අටලොස් රියන් ගල් ටැඹක් පිහිටුවා සෙල් ලිපියක් කරවීය. රන් පතක ලියා කරඬුවක බහා රජ වාසලෙහි ද තැන්පත් කළේය.

ශ්‍රී බුද්ධ වර්ෂ 383 දී රජ බවට පැමිණියා වූ දුටුගැමුණු මහ රජතුමා රුහුණේ සිට අනුරාධපුරයට සැපත්ව දෙතිස් මහා සටනකින් ජයගෙන ලංකා රාජ්‍ය එක්සත් කොට බුදු සසුන බැබල වූයේය. තිස් කෝටියක් ධනය යොදා මිරිසවැටි චෛත්‍යය ද දහනව කෝටියකින් ලෝහ ප්‍රාසාදය ද කරවා, ලක්ෂයක් වැයකොට මහා බෝධි පූජාවක් පවත්වා, දෙවන පෑතිස් මහ රජුන් ලියා තැබූ රන්පත හා ගල් ටැඹ සෙල් ලිපිය කියවා අප්‍රමාණ ප්‍රීතියට පැමිණ ස්වර්ණමාලී මහා චෛත්‍ය රාජයන් වහන්සේ නිර්මාණය කරවීමට අධිෂ්ඨාන කර ගත්තේය.

**මහ සෑයට වස්තු පහළවීම**

ලක් වැසි ජනයා නොපෙළා මහ සෑයට අවශ්‍ය වන්නා වූ වස්තු සම්භාරය කෙසේ ලබන්නෙම්දැයි දුටුගැමුණු මහ රජතුමා සිතමින් සිටිද්දී සක් දෙව් රජ අණින් විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා විසින් එකම දවසෙහි සියළු වස්තුව මවා ගියේය. අනුරාධපුරයට උතුරෙන් යොදුනක් ගිය තැන ගම්භීරනදී තීරයෙහි ගඩොල් ද, ඊසාන දිග යොදුන් තුනක් ගිය තැන අවුරුවිටි ගම රත්‍රන් ද, නැගෙනහිර දිග සත් යොදුනක් ඈත තඹවිට ගමෙහි තඹ ද, ගිණිකොන දිග සතර යොදුනක් තැන සමන් වැවේ මැණික් ද, දකුණු දිග අට යොදුනක් තැන රිදී ලෙනෙහි රිදී ද, බටහිර දිග පස් යොදුනක් තැන උරුවෙල් පටුනෙහි නෙල්ලි ගෙඩි තරම් මුතු හා පබලු ද, වයඹ දිග සත් යොදුනක් තැන පේළවාපි ගමෙහි මහා මැණික් සතරක් ද, විස්කම් දෙව් පුත් විසින් මවන ලදුව දුටුගැමුණු මහ රජතුමා වෙත ලැබී ඉමහත් සතුටින් ආරක්ෂා සංවිධාන සැලසීය.

## මහ සෑයේ කටයුතු ඇරඹීම

දීපංකර පාද මූලයේ දී නියත විවරණ ලැබීම, මනුලොව ඉපදීම ලොව්තුරා බුදුවීම, කිඹුල්වත් නුවරට වැඩම වීම, යමා මහ පෙළහර පෑම, තෙවැනි වර ලක්දිව වැඩම කිරීම, පිරිනිවීම, ලක්දිවට විජය කුමරු ගොඩ බැසීම, දෙවන පෑතිස් රජු ඔටුනු පැළඳීම, ආදී ඓතිහාසික සිදුවීම් රාශියකින් පූජනීයත්වයට පත් වූ වෙසක් පුන් පසලොස්වක් පොහෝ දින වීසා නැකතින් ස්වර්ණමාලී මහා චෛත්‍ය රාජයාණන් වහන්සේ නිර්මාණය කිරීමේ කටයුතු දුටුගැමුණු මහ රජාණන් විසින් පටන් ගන්නා ලදී.

දේවානම්පියතිස්ස මහ රජු පිහිටවූ ශිලා ස්ථම්භය ඉවත් කරවා බිම සමතලා කොට සත් රියනක් පොළවේ පස් ඉවත් කොට, යෝධයන් ලවා වටගල් අතුරුවා කුලුගෙඩියෙන් තලවා ඇතුන් ලවා පාගවා ඒ මතුයෙහි රහත් සාමණේරයන් වහන්සේලා හිමවතින් ගෙනා නවනීත මැටි අතුරවන ලදී. නවනීත මැටි මත්තෙහි ගඩොල් ද, ඒ මත බොරලු ද, බොරලු මත කුරුඳු ගල් ද, ඒ මත යකඩ දැල් ද, සුවඳ කලල් ද, ඒ මත කිරිවාණා ගල් ද, ඒ මත පළිඟු ගල් ද, ඒ මත ගල්ලෑලි ද, අතුරන ලදී. නැවත රසදිය දිවුල් මැලියම් නවනීත මැටි අනා අතුරා අඟල් අටක් ඝණ තඹ කොළ එළන ලදී. ඒ මතුයෙහි රන් සිරියල් තල තෙලින් අනා අතුරා අඟල් සතරක් ඝණ රිදී කොළ එලන ලදී. මෙසේ මහ සෑයේ පදනම සාදා නිමවා ඇසළ මස පුර පසලොස්වක් පොහෝ දින මුල් ගල් තැබීම නියම කරන ලදී.

මහ සෑ මළුව සහිත අනුරාධපුර නගරය දෙව් නුවරක් සේ සරසනු ලැබීය. දඹදිව් තලයෙන් රහතන් වහන්සේලා අනූ හය කෝටියක් අහසින් වැඩියහ. ඇසළ මස පුර පසළොස්වක් පොහෝ දින උතුරු සළ නැකතින් මහ සෑයට මුල් ගල් තැබීය. "මේ මා කරවන චෛත්‍ය කර්මාන්තය නිරුපද්‍රැතිව නිමාවට යේ නම් සෑ මලුවේ සිවු දිග බුද්ධරක්ඛිත ධම්මරක්ඛිත - සංඝරක්ඛිත - ආනන්ද නම් ඇති තෙරුණුවන් වහන්සේලා වැඩ සිටිත්වායි දුටුගැමුණු රජ අදිටන් කළේය. එය එසේම සිදුවිය. ඉන්දගුත්ත නම් මහ රහතන් වහන්සේ එසේ සිටීමට සංවිධානය කළහ.

තවද සිද්ධාර්ථ - මංගල - පදුම - සීවලී- චන්ද්‍රගුප්ත - ඉන්ද්‍රගුප්ත සූර්ය ගුප්ත - සාගර - චිත්‍රසේන - ජයසේන - අචල නම් ඇති මහ රහතන් වහන්සේලා එකොළොස් නම පුන් කලස් ඉදිරියේ නැගෙනහිර බලා වැඩ සිටි සේක. නන්දිසේන සුමනාදේවී යන මව්පියන්ගේ පුත්‍ර වූ සුප්‍රතිෂ්ඨිත නම් මංගල සම්මත අමාත්‍ය පුත්‍රයා දාගැබ වට සිසාරා ඇවිදින රිදී දණ්ඩ ගෙන ගියේය. ප්‍රමාණයෙන් අති විශාල සේ දාගැබ සිසාරා මනිනවා දුටු සිද්ධාර්ථ නම් මහ රහතන් වහන්සේ මධ්‍යම ප්‍රමාණයෙන් මැනීමට අණ කළහ. සිද්ධාර්ථ මහ රහතන් වහන්සේගේ සහ එකොළොස් මහ තෙරුණුවන්ගේද අමාත්‍ය පුත්‍රයාගේ සහ මව්පියන්ගේ ද නම් අසා චෛත්‍ය කර්මාන්තය ඒකාන්තයෙන් සාර්ථක වන්නේ යැයි දුටුගැමුණු මහ රජාණෝ විශේෂයෙන් සතුටු වූහ. මහ සෑ මැද රන් කළ අටක් රිදී කළ අටක් තබා ඒ වටා පුන් කළස් එකසිය අටක් ද, රන් ගඩොල් අටක් අට කොණ තබා ඒ එක එකට පිරිවර රිදී ගඩොල් එකසිය අට බැගින් ද තැබවීය.

නැගෙනහිර දිසාවේ වට ඇඳි රේඛාවේ චිත්‍රසේන මහ රහතන් වහන්සේ සුවඳ පිඩක් තැබූහ. ජයසේන නම් මහ රහතන් වහන්සේ සුවඳ පිඩ පැන් ඉස ඇනූහ. සුප්‍රතිෂ්ඨිත නම් මංගල සම්මත අමාත්‍ය පුත්‍රයා උතුරුසළ නැකතින් මහත් පූජා සත්කාර සහිතව නැගෙනහිර රන් ගඩොල සුවඳ පිඩ මත පිහිටුවන කෙනෙහි දෙලක්ෂ හතලිස් දහසක් යොදුන් ගණ මහ පොළොව ගුගුරමින් විශේෂයෙන් කම්පා විය. ඉතිරි සත් දිශාවේ රන් ගඩොල් ද ජීවත්වන මව්පියන් ඇති මංගල සම්මත අමාත්‍ය පුත්‍රයන් සත් දෙනෙකු ලවා එසේම පිහිටුවනු ලැබූහ.

ඉන් අනතුරුව සිවු දිග වැඩ සිටිනා වූ මහ රහතන් වහන්සේලාට පූජා සත්කාර පවත්වා මහ රජතුමා ඇතුළු පිරිස බණ ඇසීමට තැන්පත් වූහ. පියදස්සී නම් මහ රහතන් වහන්සේ එදවස් වදාළ ධර්මය ශ්‍රවණය කළ සතලිස් දහසක් දෙනා රහත් වූහ. සතලිස් දහසක් දෙනා සෝවාන් ඵලයෙහි පිහිටියාහ. දහසක් දෙනා සකෘදාගාමී වූහ. දහසක් අනාගාමී වූහ. භික්ෂූන් වහන්සේලා අටලොස් දහසක්ම රහත් වූහ. භික්ෂුණීන් වහන්සේලා ද දාහතර දහසක් රහත් වූහ.

## මහ සෑයේ ධාතු ගර්භ නිර්මාණය

දඹදිවින් වැඩම කළ අනූහය කෝටියක් පමණ මහ රහතන් වහන්සේලාට ධාතු ගර්භයේ කටයුතු නිමවන තුරු ලක්දිව වැඩ සිටීමට ආරාධනා කළ නමුත් සත් දිනකට පමණක් ආරාධනාව ඉවසූසේක් මහ රජතුමාට වැඩ අධික වන බැවිනි.

චෛත්‍ය කර්මාන්තය පිණිස බඳවා ගත් වඩු මහත්තයාට විස්කම් දෙව්පුත් ආවිෂ්ඨ වී රන් තලියක පැන් පුරවා නිය පිටින් දිය පිට ගසා පළිඟු බුබුලක් සේ දිය බුබුලක් නංවා ඒ හා සමාන පෙනුමකින් මහ සෑය කරවීමට රජතුමා සතුටු කරවා ගත්තේය. මිළ නොගෙවා කිසිවෙකුගෙන් අත් වැඩ නොගන්නා ලෙසද විශේෂයෙන් විධාන කළහ. රහතන් වහන්සේගේ අධිෂ්ඨානය පරිදි මහ සෑයේ තුන් මල් පේසාව තෙක් ගොඩ නැංවූ නව වාරයක් පොළොවට ගිලා බැස්සේ භූමි චලනයකින්වත් ධාතු ගර්භය නොසෙල්වෙනු පිණිසය.

මහ රහතන්වහන්සේලාගේම විධානයෙන් උත්තරය, සුමනය නම් ඇති රහත් සාමණේරයන් වහන්සේ දෙනම උතුරුකුරු දිවයිනෙන් අසූ රියන් දිග පළල ඇති අට රියනක් ඝණ ඇති මේදෝ වර්ණ ගල් පුවරු සයක් ගෙනවුත් මහ සෑයේ එකක් අතුරා ඒ මත සිවු දිගින් සතරක් සිටුවූ කල්හි අධිෂ්ඨාන බලයෙන් මනාව සන්ධි වූහ. ඉතිරි ගල් පියන වැඩ නිම වූ කළ වැසීමට සඟවා තැබූහ.

ධාතු ගර්භය තුළ සියලු කර්මාන්ත සත් රුවනින්ම කරවූහ. දීපංකර පාද මූලයේ පටන් බුද්ධත්වය දක්වා වූ සියලු විස්තරද, බුදුවීමේ පටන් පිරිනිවීම දක්වා සියලු බුද්ධ චරිතයද, පරිනිර්වාණයේ පටන් දඹදිවින් ලක්දිව බුදු සසුන පිහිටුවීමා දී සියලු විස්තර ද, සත්රුවනින්ම කරවූහ. ධාතු ගර්භය මැද නැගෙනහිරට මුහුණලා තුදුස්රියන් වජ්‍රාසනය කෝටියක් අගනාසේ කරවූහ. අටලොස් රියන් උස බෝධීන් වහන්සේ ද සත් රුවනින්ම කරවූහ. කෝටියක් අගනාසේ උතුරු දිගට හිසලා පරිනිර්වාණ මඤ්චකය ද රිදියෙන් කර වූහ. ඒකාසංඛ්‍යෙය කල්ප ලක්ෂයක් මුළුල්ලේ පිරූ පාරමිතා ඇති දුටුගැමුණු මහ රජාණන්ගේ පුණ්‍ය

සෘද්ධියෙන් හා දෙවියන්ගේ දේව සෘද්ධියෙනුත් රහතන් වහන්සේලාගේ අධිෂ්ඨාන සෘද්ධි බලයෙනුත් ධාතු ගර්භයේ සියලු බුද්ධ චරිතය ඉතිරි නැතිව සත් රුවනින් පියවි මිනිස් පමණින්ම නිම කරවූහ. මුල පටන් වැඩ නිමවන තෙක් විස්කම් දෙව් පුත් චෛත්‍ය කාර්මික වඩු මහතාට ආවේශව වැඩ කළ අතර ෂඩ් අභිඥාලාභී ඉන්ද්‍රගුප්ත මහරහතන් වහන්සේ විශේෂයෙන් චෛත්‍ය කර්මාන්තය සංවිධානය කළහ.

## ශ්‍රී සර්වඥ ධාතූන් වැඩම කරවීම

සර්වඥ සම්බුදු රජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා නැලි දෙක බැගින් රටවල් අටක රජ දරුවන් විසින් චෛත්‍යයන්හි නිධාන් කරවා පූජා සත්කාර කරනු ලැබූහ. නැවත මහා කාශ්‍යප මහරහතන් වහන්සේ විසින් සර්වඥ ධාතූන් වහන්සේලාගේ ආරක්ෂාව පිණිස රාම ග්‍රාමයෙහි ධාතු නිධානය හැර ඉතිරි ස්ථාන සතෙන්ම ධාතූන් වහන්සේලා එක්තැන් කොට අජාසත් මහා රජුගේ සහායෙන් වාළුසංඝාට චෛත්‍යයේ නිධාන් කරවනු ලැබූහ.

රාම ග්‍රාමයෙහි කෝලිය රජුන් විසින් බඳිනා ලද චෛත්‍ය වනාහී ගංගාව සමීපයේ වූ බැවින් මහ වතුරෙන් සෑය බිඳී ධාතු කරඬුව මුහුදට වැටිණි. නාගයෝ එම ධාතු කරඬුව මාඤ්ජේරික නම් නාග භවනයට වැඩම කරවා මහාකෙල නම් නා රජු හට භාර දුන්හ. මහාකෙල නා රජු සත් රුවන් මණ්ඩපයක ධාතු කරඬුව වඩා හිඳුවා පූජා සත්කාර කරමින් ආරක්ෂා කළේය.

සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අධිෂ්ඨානය පරිදි එම රාම ග්‍රාමයෙහි නිහිත නැලි දෙකක් පමණ වූ ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා ස්වර්ණමාලී චෛත්‍ය රාජයන් වහන්සේ තුළ නිධන් කිරීමට නියමිත වූ සර්වඥ ධාතූන් වහන්සේලා වෙති.

ඇසළ පුන් පසළොස්වක් පොහෝ දින උතරුසළ නැකතින් මහ සෑයේ ධාතු නිධානෝත්සවය නිල කරගත් දුටුගැමුණු මහ රජාණෝ තුදුස්වක් දින මහා සංඝයා වහන්සේ වැඳ සෙට දින ධාතු නිධානය

නියමිත බවත් සර්වඥ ධාතූන් වහන්සේ ලබා දෙන ලෙසත් ආරාධනා කළහ. මහා සංඝයා වහන්සේ ෂඩ් අභිඥාලාභී සෝනුත්තර සාමණේරයන් වහන්සේට විධාන කළ සේක.

සක් දෙව් රජ අණින් පැමිණි විස්කම් දෙව් පුත් මුළු ලක් දෙරණ බෙර ඇසක් සේ සමතලා කොට සුදු වැලි ඉස දෙව් පුරයක් සේ අලංකාරව සැරසීය. මුළු සක්වල ලොව්තුරා සර්වඥයන් වහන්සේ ඉපදීම - බුදුවීම - දම්සක් දෙසීම් මංගල දිනයන්හි සේම අලංකාරව සැරසී සිටියේය. ලක්වැසි ජනතාව ඔකඳව උත්සවයට සැරසී ගත්තේය. දුටුගැමුණු මහ රජතුමා ද සව් බරණින් සැරසී ශක්‍ර දේවේන්ද්‍ර ලීලාවෙන් මහ සෑ මළුව වෙත සහපිරිවෙරින් නික්මිණ, අනූහය කෝටියක් රහතන් වහන්සේලා ද අහසින් පැමිණ මහ සෑ මලුවේ රැස්වූහ.

පුද පිරිවෙන් වැසි සෝනුත්තර සාමණේරයන් වහන්සේ සැණෙකින් සඟ අණ පරිදි නා ලොවට වැඩ මහකෙළ නා රජුගෙන් සර්වඥ ධාතූන් වහන්සේ ලබා ගැනීමට පෙනී සිටියහ. මහකෙළ නා රජු හුනස්නෙන් නැගිට සුවඳ පැනින් පා දොවා වඩා හිඳුවා සුවඳින් මලින් පුද වැඳ නමස්කාර කොට සෝණුත්තර සාමණේරයන් වහන්සේගෙන් තොරතුරු විමසීය.

මහරජ! මා පැමිණියේ ලංකා ද්වීපයේ සිටය, දුටු ගැමුණු මහ රජතුමා විසින් අද උතුම් සුභ මොහොතෙහි මහ සෑයෙහි ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේ නිධාන් කරනු පිණිස මහ සංඝයා වහන්සේට ආරාධනා කරන ලදුව සංඝයාගේ අණින්, ඔබ වෙත ඇති ධාතූන් වහන්සේ රැගෙන යාමට ආවෙමියි වදාළහ. සර්වඥයන් වහන්සේගේ අධිෂ්ඨානය පරිදි රුවන්මැලි මහ සෑයෙහි නිධන් කිරීමට නියමිත ද්‍රෝණයක් පමණ සර්වඥ ධාතූන් වහන්සේ ඔබ වෙත ඇති බවත් වැඩි දුර ප්‍රකාශ කළහ. මහකෙළ නා රජු ධාතූන් වහන්සේලා නොදෙනු කැමතිව වාසුලදත්ත නම් වූ තම බෑණනුවන්ට ඉඟියකින් සංඥා දී ධාතු කරඬුව සැඟවීය. වාසුලදත්ත ධාතු කරඬුව ගිල මහමෙර පසෙක ආරක්ෂා සහිතව සැඟවී සිටියේය. ධාතු කරඬුව සඟවා ගත් බව දැනගත් මහකෙළ නා රජ සෝණුත්තර සාමණේරයන් වහන්සේ ධාතු මණ්ඩපය වෙත පමුණුවා තමන් ධාතූන් වහන්සේ උදෙසා කරන පූජා සත්කාර පෙන්වීය.

කොතෙක් පූජා සත්කාර කළද සර්වඥයන් වහන්සේ සතුටු වන්නේ මඟ ඵල නිවන් අවබෝධ කර ගැනීමෙන් බවත් අධිගම ලාභීන් උදෙසා මේ සර්වඥ ධාතූන් වහන්සේ දෙන ලෙසත් සාමණේරයන් වහන්සේ වදාළහ. "ස්වාමීනි! මා සමීපයෙහි ධාතූන් වහන්සේ නැති බවත් ලක්දිවට වැඩ මහා සංඝයාට කියා වෙනත් තැනකින් ධාතූන් වහන්සේලා ලබා ගන්නා ලෙසත් කියනු මැනවයි" මහකෙළ නාග රාජයා පැවසීය. ෂඩ් අභිඥාලාභී සෝණුත්තර සාමණේරයන් වහන්සේ ද සිදුවූ සියල්ල දිවසින් දැන වදාළ හෙයින් "මහරජ! ධාතූන් වහන්සේලා ඇතොත් ගන්නද? ඇතොත් ස්වාමීනී ගනු මැනවැයි" තුන් වරක් ගිවිස්වා ගෙන එසේ කථා කරද්දීම නා රජුට නොදැනෙන සේ සියුම් අතක් මවා වාසුලදත්ත ගිලගෙන සිටි ධාතු කරඬුව රැගෙන, එසේ නම් නා රජුනි! මම යමියි සැණෙකින් නා ලොවින් අතුරුදන් ව මහ සෑ මළුවට වැඩ මහා සංඝයා වහන්සේට ශ්‍රී සර්වඥ ධාතු කරඬුව භාර දුන්හ.

සෝණුත්තර සමිඳුන් හිස් අතින් ගියේ යැයි සිතූ මහකෙළ නා රජ සිය බෑණනුවන් ගෙන්වා ඇසීය. ධාතු කරඬුව නැති බව දැන දෙදෙනාම හඬා වැළපී සහ පිරිවරින් මනු ලොවට පැමිණ මහ සංඝයා වහන්සේගේ පාමුල වැඳ වැටී බැගෑපත්ව ධාතූන් වහන්සේ ආපසු දෙන ලෙස ඇයැදීය. මහා සංඝයා වහන්සේ ද බණ කියා සිත සනසවා ස්වල්ප මාත්‍රයක් ධාතූන් වහන්සේ ඔවුනට භාර දුන්හ. මහා සංඝයා වහන්සේ වෙතින් ශ්‍රී සර්වඥ ධාතු කරඬුව හිස මතට ගත් දුටු ගැමුණු මහ රජාණෝ දෙවියන් බ්‍රහ්මයන්ගේද අනේක පූජා සත්කාර මැද්දේ රත්න මණ්ඩපයෙන් පිටත්ව දාගැබ තෙවිටක් පැදකුණු කොට නැගෙනහිර දිගින් දාගැබට පිවිස කෝටියක් අගනා රිදී ආසනයෙහි තැන්පත් කිරීමට සිතූහ. සර්වඥ රාජෝත්තමයන් වහන්සේගේ අධිෂ්ඨානය පරිදි ධාතු කරඬුව අහසට පැන නැගී විවෘතවී ද්‍රෝණයක් පමණ වූ ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා නිර්මිත බුද්ධ විලාශයෙන් මැවී රුවන් සක්මනට නැගී සවණක් ඝන බුදුරැස් විහිදුවමින් සැවැත් නුවර ගණ්ඩම්බ වෘක්ෂ මූලයේදී සේ අසිරිමත් වූ යමා මහ පෙළහර පා වදාළ සේක.

ආශ්චර්යවත් වූ ඒ ප්‍රාතිහාර්යය දුටු දොළොස් කෝටියක් දෙනා සිවුපිළිසිඹියා සහිත රහත් බවට පත්වූහ. සෝවාන් සෙදගැමි අනාගාමී බවට පත්වූවන්ගේ ගණන මෙතෙකැයි සීමාවක් නොවීය. දුටු ගැමුණු මහ රජතුමා අසීමිත ප්‍රීතියෙන් පින පිනා "මාගේ ආත්මභාවයෙහි ඵල ලදිමි"යි සතුටුව සිය හිස මතට වැඩම කළ ධාතු කරඬුව සුවඳින් දෙවූ අතින් ගෙන උත්තර ශීර්ෂකව පැන වූ කෝටියක් අගනා රිදී යහනෙහි ඇතිරවූහ. සර්වඥ අධිෂ්ඨානය පරිදි සිංහ සෙයියාවෙන් සැතපෙන බුදුරුවක් මැවී සියළු සර්වඥ ධාතූන් වහන්සේ බුදුරුව තුල නිධාන් ගත වූහ.

ඇසළ මස පුර පසලොස්වක් පොහෝ දින උතුරුසළ නැකතින් මෙසේ ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කරන සුභ මොහොතේ මහා පෘථිවිය ශතරාව සහශ්‍රරාව නංවමින් විශේෂයෙන් කම්පා විය. දෙතිසක් මංගල්‍ය පූර්ව නිමිති පහළ වූහ. අනේක ආශ්චර්ය ප්‍රාතිහාර්ය සහශ්‍රයන්ගෙන් තුන් ලෝක ධාතුව අලංකාර විය. රුවන්මැලි චෛත්‍ය රාජයන් වහන්සේගේ ධාතු නිධානය නිම වූ කල්හි උත්තර - සුමන රහත් සාමණේරයන් වහන්සේ දෙනම සඟවා තැබූ ගල් පියන ධාතු ගර්භය මත තබා වදාළහ. භූමි කම්පාවකිනුත් නොසෙල්විය හැකි සේ ධාතු ගර්භය සුපිහිත විය. එදවස් පූජා කළ සමන් පිච්ච මල් ශාසනාන්තය තෙක් පර නොවෙති. දැල්වූ ගිතෙල් පහන් නොනිවෙති. සුවඳ සඳුන් කලල් නොවේලෙති. ධාතු ගර්භයේ ඉරි තැලීමක් වත් ඇති නොවන්නේය. පුදන ලද රත්න වර්ගයන්හි මළ නොබැඳෙන්නේය. ඒ සෑම රහතන් වහන්සේගේ අධිෂ්ඨාන බලයෙන් සිදුවූයේය. පර සතුරන් විසින් ධාතු ගර්භය දැකීමටවත් නොලැබේවායැයිද විශේෂයෙන් අධිෂ්ඨාන කරන ලද්දේය.

තවද රජතුමාගේ නියමයෙන් ලක් වැසි ජනතාව ධාතු ගර්භය මත රන් කරඬු රිදී කරඬුව ආදී අනේක වස්තු සහිතව තවත් සර්වඥ ධාතූන් වහන්සේලා දහසක් පමණක් තැන්පත් කළහ. අසදෘශ ස්වර්ණමාලී මහා චෛත්‍ය රාජයාණන් වහන්සේ සතරැස් කොටුව දක්වා බැඳ නිමවූ කල්හි අනූහය කෝටියක් රහතන් වහන්සේලා පිරිත් දේශනා කරද්දී සූවිසි වසරක් ලක් රජය කළ දුටු ගැමුණු මහ රජතුමා පින් පොත කියද්දී මහ සෑ රදුන් බල බලාම චුතව තුසිත භවනයේ දෙව් රජ කෙනෙක්ව උපන්නේය.

සොහොයුරු සද්ධාතිස්ස මහ රජතුමා මහාසෑයේ අවසේස කටයුතු නිමවා තුසිත පුරයේම උපන්නේය. මතු බුදුවන මෛත්‍රී සර්වඥ ශාසනයේ දී දුටුගැමුණු රජතුමා දකුණාත් සව් වන්නේය. සද්ධාතිස්ස රජතුමා වමත් සව් වන්නේය. කාවන් තිස්ස - විහාර මහා දේවී දෙදෙනා මෙතේ මුණිදුන් හට මව්පියෝ වන්නාහ. කාවන් තිස්ස රජුගේ නැගණිය වූ අනුලා දේවිය මෙතේ බෝසතුන්ගේ අග මෙහෙසිය වන්නීය. සාළිය කුමාරයා මෙතේ බෝසතුන්ගේ පුත් වන්නේය. දුටු ගැමුණු රජුගේ භාණ්ඩාගාරික සංඝ නම් අමාත්‍යයා මෙතේ මුනි රජුගේ අග්‍ර උපස්ථායක ද එතුමාගේ දියණිය අග්‍ර උපස්ථායිකාව ද වන්නේය.

ඒවං අචින්තියා බුද්ධා
බුද්ධ ධම්මා අචින්තියා
අචින්තියෙසු පසන්නානං
විපාකො හොති අචින්තියො

සර්වඥ සම්බුදු රජාණන් වහන්සේලා මෙසේ අචින්තෙයය ගුණ ඇත්තෝය. බුද්ධ ධර්මය ද අචින්තියය, අචින්තිය ගුණ ඇත්තා වූ බුද්ධාදී රත්නත්‍රය කෙරෙහි පැහැදී කළ පින් ඇති අයට ලැබෙන ආනිසංස ඵල විපාකය ද සිතා නිම කළ නොහැකි වන්නේය.

සයිංසු යස්මිං සුගතස්ස ධාතු
නිම්මාය රන්සුජ්ජල බුද්ධ රූපං
සුවණ්ණ මාලීති පතිත නාමං
වන්දමහං ථූපවරං මහග්ඝං

ද්‍රෝණයක් පමණ වූ ශ්‍රී සර්වඥ ධාතූන් වහන්සේලා බුදුරැස් විහිදෙන බුද්ධ ප්‍රතිමා වහන්සේ තුල යම් දාගැබක සැතපෙන සේක්ද ස්වර්ණමාලි නම් සුප්‍රසිද්ධ නාමයක් ඇත්තා වූ ඒ මහාර්ඝ වූ චෛත්‍ය රාජයන් වහන්සේට දොහොත් මුදුනේ තබා පසඟ පිහිටුවා බුද්ධාලම්බණ ප්‍රීතිය උපදවා ආදර ගෞරව බහුමානයෙන් නමස්කාර කරමි. සාධු! සාධු!! සාධු!!! මාගේ නමස්කාරය වේවා!

# ධම්ම දානානිසංස අනුමෝදනය

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවාලමින් ප්‍රතිපත්තිමය බුද්ධ ශාසනය නගා සිටුවාලූ අති පූජනීය කඩවැද්දුවේ ජිනවංශාභිධාන මහා නායක ස්වාමීන් වහන්සේට ලොවුතුරු සම්මා සම්බුද්ධ රාජ්‍යය පිණිසම මේ කුසලය ඒකාන්තයෙන් උපනිශ්‍රය වේවා.

සම්බුද්ධ ශාසනයේ චිර ජීවනය පිණිස, ප්‍රතිපත්තිමය බුද්ධ ශාසනය නගා සිටුවන්නා වූ අති පූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේට ලොවුතුරා සම්බුද්ධ රාජ්‍ය පිණිසම මේ කුසලය ඒකාන්තයෙන් හේතු වේවා. 2006 ක්වූ බක් මස 24 වන දින 68 වන ජන්ම දිනයට පා තබන අපගේ මහ නාහිමියන් නිදුක් නිරෝගීව චිරාත් කාලයක් ශ්‍රී සම්බුද්ධ ශාසනය බබලවමින් වැජඹේවා.

අප සැමට නිරන්තරයෙන් අවවාද අනුශාසනා ලබා දෙමින් මෙම උදාර පුණ්‍ය කර්මය කිරීමට අපව දිරිමත් කළාවූ ගෞරවණීය අටමස්ථානාධිපති අතිගරු පල්ලේගම සිරිනිවාස නාහිමියන් වහන්සේ, ස්වර්ණමාලී මහා සෑ විහාරාධිපති අතිගරු පල්ලේගම සිරිසුමණ හේමරතන නාහිමියන් වහන්සේ ඇතුළු ථූපාරාම විහාරාධිපති අතිගරු ගල්කිරියාගම සෝරත නාහිමියන් වහන්සේටද ලොව්තුරු නිර්වාණ සුවය පිණිස මේ කුසලය ඒකාන්තයෙන් හේතු වේවා.මෙම පිංකමට අනුශාසනා කළා වූ අති පූජනීය මහා සංඝ රත්නයටත් මේ කුසලය හා සම්බන්ධවන සියලු දෙනාට මොහොතක් පාසා බුද්ධාලම්බන ප්‍රීතිය පහළ වේවා! ශීල ගුණ බණ භාවනා වඩා දෙලොව ජයගෙන අමා මහ නිවන් සුවය ලැබීම පිණිස මෙම කුසලානිසංස පිංකම ඒකාන්තයෙන් හේතු වේවා.

දස දිසාවේ සිටින බෞද්ධ ජනතාව ප්‍රතිපත්ති ධර්මයෙහි පිහිටමින් දහම් සිසිලෙන් සැනසේවා.

මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කිරීම පිණිස අකුරු සැකසීම, කවර නිර්මාණය ඇතුළු සියලු කටයුතු ඉමහත් ධර්ම ගෞරවයෙන් බුදුපියාණන්වහන්සේ උදෙසා පූජානිසංස අරමුණෙන් සිදුකරණ ලද පිංවත් ප්‍රබුද්ධා ඉංදීවරී නැගනිය සහ "අරියමග්ග" සංවිධානයේ සාමාජික සියලු දෙනා ඇතුළු අපට අනුග්‍රහ, ආශිර්වාද සපයන සියළු දෙනාටමත් මේ ධර්මදානානිසංස පුණ්‍ය සම්භාරය අත්වේවා. සුගතිගාමීව ශාන්ති ලක්ෂණ නිර්වාණ සම්පත් අවබෝධ වේවා.

අනන්ත අප්‍රමාණ දෙව් මිනිසුන් සහිත ලෝකයාට නිවන් සුව පිණිස හේතු වූවා වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේ දේශනාකොට වදාලා වූ ශ්‍රී සද්ධර්මය මුළු මහත් ලෝක ධාතුව තුළ බැබළේවා!

සියලු සත්වයෝ සුවපත් වෙත්වා!

මෙයට කාරුණික "අරියමග්ග සංවිධානය"

2550 - 2006

සයිංසු යස්මිං සුගතස්ස ධාතු
නිම්මාය රන්සුජ්ජල බුද්ධ රූපං
සුවණ්ණ මාලීති පතිත නාමං
වන්දමහං ථූපවරං මහග්ඝං

ද්‍රෝණයක් පමණ වූ ශ්‍රී සර්වඥධාතූන් වහන්සේලා බුදුරැස් විහිදෙන බුද්ධ ප්‍රතිමා වහන්සේ තුල යම් දගැබක සැතපෙන සේක්ද ස්වර්ණමාලි නම් සුප්‍රසිද්ධ නාමයක් ඇත්තා වූ ඒ මහාර්ඝ වූ චෛත්‍ය රාජයන් වහන්සේට දොහොත් මුදුනේ තබා පසඟ පිහිටුවා බුද්ධාලම්බණ ප්‍රීතිය උපදවා ආදර ගෞරව බහුමානයෙන් නමස්කාර කරමි.

සාධු ! සාධු !! සාධු !!!

මාගේ නමස්කාරය වේවා!

2550
බුද්ධ ජයන්තිය

වයඹ ප්‍රින්ටර්ස් - කුරුණෑගල. 037 2222804